ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2022 (2023)

විෂය අංකය / பாட இலக்கம்: 32

විෂයය / பாடம்: ව්‍යාපාර අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 1 |
| 02. | 4 | 12. | 5 | 22. | 2 |
| 03. | 2 | 13. | 4 | 23. | 4 |
| 04. | 5 | 14. | 1 | 24. | 3 |
| 05. | 1 | 15. | 1 | 25. | 3 |
| 06. | 3 | 16. | 2 | 26. | 2 |
| 07. | 5 | 17. | 5 | 27. | 3 |
| 08. | 4 | 18. | 4 | 28. | 5 |
| 09. | 2 | 19. | 2 | 29. | 1 |
| 10. | 3 | 20. | 4 | 30. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 30 = 60

31 සිට 50 දක්වා සෑම පිළිතුරකටම ලකුණු ½ බැගින් හිමි වේ.

31. අ) වෙළෙඳාම, උපකාරක සේවා
    ආ) අභ්‍යන්තර, ආසන්න/කර්මාන්ත/කාර්යය

32. අ) මූලික/කායික, ගරුත්ව/මෙත්ව
    ආ) මූල්‍ය, මිල

33. අ) කොටස් හැඩවිකාර, ප්‍රාරක්ෂකයන්
    ආ) සාමාජීය, අභ්‍යන්තර

34. අ) අර්ථසාධක (Provident), භාරකාර (Trust)
    ආ) ප්‍රවාසිතාවය, සේවය අතහැර යාම.

35. අ) විකුණුම්, අලෙවිකරණ
    ආ) බුද්ධිමය, වෙළෙඳ

36. අ) මුදල්, ප්‍රාග්ධන (අනුපිළිවෙළ අවශ්‍යය නොවේ)
    ආ) SWIFT/ SLIPS

37. අ) ද්‍රවශීලතා, ආයෝජන
    ආ) මුදල්, ප්‍රාග්ධන

38. අ) ප්‍රජාතන්ත්‍රවාදි, ඒකාධිපති
    ආ) ඇතුළතට නැඹුරු (Inbound) /ආමුඛ, පිටතට නැඹුරු (Outbound)/ප්‍රතිමුඛ

39. අ) පසුපස (Backward), ඉදිරිපස (Forward)
    ආ) රඳවා ගැනීමේ/කල්-තබාගැනීමේ, තබාගැනීමේ

40. අ) ආයතන (Establishment), මූල්‍ය (Financial)
    ආ) ආකේතනය/ සංකේතකරණය (Encoding), /විකේතනය/ සංකේතහරණය (Decoding)

41. 1) විචාරාත්මක දැනුවත්භාවය
    2) සක්‍රිය සහභාගිත්වය
    3) සමාජය ගැන සැලකිලිමත් වීම.
    4) පරිසරය ගැන සැලකිලිමත් වීම.
    5) සහයෝගිතාවය

42. 1) මහජන වගකීම රක්ෂණය
    2) නිෂ්පාදිත වගකීම් රක්ෂණය
    3) සේවා්‍යය වගකීම රක්ෂණය
    4) මාර්ගස්ථ මුදල් භාණ්ඩ රක්ෂණය
    5) වෘත්තීය වගකීම රක්ෂණය/අධ්‍යක්ෂක සහ නිලධාරීන්ගේ වගකීම රක්ෂණය

43. 1. මාර්ගය
2. මාධ්‍යය
3. බලය
4. පර්යන්තය

44. 1. කාර්යය
2. නිෂ්පාදිත
3. පාරිභෝගික
4. භූගෝලීය
5. මිශ්‍ර
6. ක්‍රියාවලි
7. න්‍යාස
8. අතථ්‍ය (Virtual)

45. 1. නිෂ්පාදිතයකට නිශ්චිත ආයුකාලයක් ඇත.
2. නිෂ්පාදිතයක් අලෙවිකරුවාට වෙනස් වෙනස් අභියෝග ගෙන දෙන විවිධ අදියර කිපයක් පසු කරයි.
3. භාණ්ඩයක ජීවන චක්‍රයෙහි විවිධ අදියරවලදී විකුණුම් හා ලාභය වෙනස් වේ.
4. නිෂ්පාදිතයක ගමන් කරන එක් එක් අදියරේ විවිධ ස්වරූප අනුව අලෙවිකරුවා විසින් ඊට අදාළ අලෙවිකරණ අරමුණු හා උපායමාර්ග අනුගමනය කරයි.

46. 1. සම්මුඛ පරීක්ෂණය
2. බුද්ධි පරීක්ෂණය
3. පෞරුෂ පරීක්ෂණය
4. වෛද්‍ය පරීක්ෂණය
5. පසුබිම් පරික්ෂණය
7. සිද්ධි අධ්‍යයනය

47. A. කාර්ය නිෂ්පාදනය/ඇණවුම් (Job Production)
B. කාණ්ඩ නිෂ්පාදනය/ සමූහ (Batch Production)
C. ප්‍රවාහ නිෂ්පාදනය / මහා පරිමාණ නිෂ්පාදනය (Flow Production)
D. අඛණ්ඩ / ක්‍රියාවලි නිෂ්පාදනය (Continous/process production)

48. 1. පැහැදිලි ඉම (Focus)
2. ගණුදෙණුකරුවන් (Customers)
3. ඉලක්ක (Target)
4. අවශ්‍ය මූල්‍ය සම්පත් (Requifed Finance Resourse)

49. 1. ඕනෑම ස්ථානයකින්, ඕනෑම උපාංගයකින් ළඟා විය හැක.
2. දෘඩාංග හා මෘදුකාංග මිලදී ගැනීමට අවශ්‍ය නොවීම.
3. මධ්‍යගත දත්ත ආරක්ෂණයක් සිදුවීම.
4. ඉක්මණින් භාවිත කළ හැකි වීම.
5. ක්ෂණික ව්‍යාපාර අවබෝධයක් ලැබීම.
6. පිරිවැය අඩුවීම.
7. කාර්යක්ෂමතාවය වර්ධනය වීම.

50. (I)
1. පුද්ගල සහකාර සේවා
2. ස්වයංක්‍රීය ප්‍රතිචාර දැක්වීම.
3. ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය
4. විකුණුම් හා ව්‍යාපාර පුරෝකථනය
5. ආරක්ෂාව පිළිබඳ විමසිලිමත් වීම. (ඕනෑම එකකට ලකුණු 1/2)

(II)
1. ව්‍යාපාරික ගණුදෙනු සිදු කළ හැකිවීම.
2. ක්ෂණිකව වෙබ් පිටුවට ප්‍රවේශ විය හැකි වීම.
3. පණිවුඩ යැවිය හැකි වීම.
4. APP බාගත හැකි වීම.
5. ව්‍යාපාරික ස්ථානය හඳුනා ගත හැකි වීම.
6. විද්‍යුත් වාණිජ්‍යය කටයුතුවලට යොදා ගත හැකි වීම. (ඕනෑම එකකට ලකුණු 1/2)

(III)
1. සොයා ගැනීම (Tracking)
2. කාලය නිර්ණය කිරීම (Timing)
3. මාර්ග තදබදය මග හැරීම (Avoid Traffic)
4. පිරිවැය තීරණය කළ හැකි වීම.
5. අදාළ ස්ථානය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වීම. (ඕනෑම එකකට ලකුණු 1/2)

(IV)
1. මෝස්තර නිර්මාණය කළ හැකි වීම.
2. නිර්මාණ පරීක්ෂාවට ලක් කළ හැකි වීම.
3. මෝස්තර දියුණු කළ හැකි වීම.
4. විවිධ ස්ථානවල සිට මෝස්තර නිර්මාණයට සම්බන්ධ විය හැක.

(ඕනෑම එකකට ලකුණු 1/2)

(ආ) 1. අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට

~~2. ඉඩම් ගොඩකිරීමට~~

~~3. අපද්‍රව්‍ය පුළුස්සා දැමීම.~~

4. අපද්‍රව්‍යය සංයුක්ත කිරීම.

(3R.) - Reduce - Reuse - Recycle

(කරුණු දෙකකට ලකුණු 2)

(iv) ඉහත සිද්ධිය හා සම්බන්ධ සාර්ව පරිසර ප්‍රවණතා දෙකක් හඳුනාගෙන, ඒවා මෙම සමාගමට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04 යි)

| සාර්ව පරිසර ප්‍රවණතා | බලපාන ආකාරය |
|---|---|
| 1. ~~අපද්‍රව්‍යය බැහැර කිරීම~~ | • පිරිවැයට<br>• ප්‍රජාව ගැන සැලකිලිමත්වීම<br>• සෞඛ්‍යය හා ආරක්ෂක ගැටලු<br>• ~~සේවකයන්~~ පිළිබඳ සැලකිලිමත්වීම. |
| 2. ~~අපද්‍රව්‍ය කළමනාකරණය~~ | • පිරිවැය<br>• ~~සෞඛ්‍යය හා ආරක්ෂක ගැටලු~~<br>• ~~ප්‍රජාව ගැන සැලකිලිමත්ව වීම.~~ |
| 3. ආර්ථික පරිසරය | • ඉල්ලුම අඩු වීම.<br>• නිෂ්පාදනය අඩුවීම.<br>• නිෂ්පාදනය පිරිවැය වැඩි වීම.<br>• ~~ආනයන සීමා කිරීම.~~ |
| ~~4. ස්වාභාවික පරිසරය.~~ | • ~~අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලු~~ |

(සාර්ව පරිසර ප්‍රවණතා 2කට ලකුණු 1 x 2 = ලකුණු 2

බලපාන ආකාරය කරුණු 1කට ලකුණු 1 x 2 = ලකුණු 2)

(v) සුවපා සමාගමේ කළමනාකරණය අනාගතයේ දී පාවහන් නිෂ්පාදනය නතර කිරීමට අදහස් කළහොත්, ඒ තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදුවිය හැකි බලපෑම් දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

1. විරැකියාව ඉහළ යාම
2. බදු ආදායම පහළ යාම.
3. වෙළඳපලේ භාණ්ඩ හිඟයක් ඇති වීම.
4. සැපයුම්දාමය ඇණහිටීම.

(කරුණු 01කට ලකුණු බැගින් ලකුණු 1 x 2 = ලකුණු 02

විස්තර කිරීමට ලකුණු 02)

## I කොටස

1. 'සුවපා' සමාගම දේශීය අමුද්‍රව්‍ය භාවිත කරමින් පාවහන් නිෂ්පාදනය කර ඒවා දේශීය හා විදේශීය වෙළෙඳපොළවලට අලෙවි කරයි. වර්තමානයේ රට තුළ පවතින ආර්ථික අර්බුදය සහ ආනයන සීමා කිරීම හමුවේ මෙම සමාගම අවදානම් රැසකට මුහුණ දී සිටී. එමෙන් ම, නිෂ්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යාමට විදුලිය හා ඉන්ධන අර්බුදය බලපා ඇත. තව ද, පාවහන් නිෂ්පාදනය තුළින් ඇතිවන අපද්‍රව්‍ය බැහැර කිරීමේ හා කළමනාකරණය කිරීමේ ගැටලුවකට ද සුවපා සමාගම මුහුණ දෙමින් සිටී.

(i) (අ) ව්‍යාපාරයක 'අවදානම' යනුවෙන් කුමක් අදහස් කෙරේ ද? (ලකුණු 02 යි)
(ආ) සුවපා සමාගමට බලපා ඇති අවදානම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(i) (අ) ව්‍යාපාරික ලාභ/අලාභ උපරිම වීමට හා අවම වීමට බලපෑ හැකි අවාසිදායක තත්ත්වයන් අවදානම් ලෙස හැඳින්වේ.

හෝ

ලාභ ලැබීමට ඇති අවිනිශ්චිතතාවය සහ අලාභ සිදු වීමට ඇති හැකියාව අවදානම් වේ.

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 2)

(ආ) 1. විදුලි අර්බුදය
2. ඉන්ධන අර්බුදය.
3. අපද්‍රව්‍ය බැහැර කිරීම.
4. අපද්‍රව්‍ය කළමනාකරණය
5. රජයේ ප්‍රතිපත්තිවල වෙනස්වීම (ආනයන-සීමා-කිරීම)
6. රටේ පවතින ආර්ථික අර්බුදය

(කරුණු 4කට ලකුණු 1/2 බැගින් 4 x 1/2 = ලකුණු 2)

(ii) (අ) රජය විසින් නිමි පාවහන් ආනයනය සීමා කිරීම සුවපා සමාගමට බලපාන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)
(ආ) නිමි පාවහන් ආනයනය සීමා කිරීම තුළින් පාරිභෝගිකයන්ට සිදුවන අවාසි දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) දේශීය වෙළෙඳපළේ තරගකාරිත්වය අඩුවීම නිසා ඉල්ලුම ඉහළ යාමෙන් විකුණුම් වැඩි වී ව්‍යාපාරයේ ලාභය ඉහළ යාමයි.

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 2)

(ආ) 1. මිල වැඩි වීම.
2. තෝරා ගැනීමේ ඉඩකඩ අඩුවීම.
3. දේශීය නිෂ්පාදිතවල ගුණත්වය අඩුවුවත් මිලදී ගැනීමට සිදු වීම. (ගුණාත්මක භාණ්ඩ මිලදී ගැනීමට ඇති අවස්ථා අහිමි වීම.)

(එක් අවාසියකට ලකුණු 01 බැගින් 1 x 2 = ලකුණු 2)

(iii) (අ) විදුලි අර්බුදය හා සම්බන්ධ පිරිවැය කළමනාකරණය කිරීම සඳහා සුවපා සමාගමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් යෝජනා කරන්න. (ලකුණු 02 යි)
(ආ) මෙම සමාගමට අපද්‍රව්‍ය කළමනාකරණය කළ හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) 1. සූර්ය බලශක්ති ප්‍රභවයන් වෙත යොමු වීම.
2. ඩීසල්/පෙට්‍රල් විදුලි උත්පාදක යන්ත්‍ර භාවිතය.
3. විදුලි පරිභෝජන කාර්යක්ෂම උපකරණ භාවිතය.
4. විදුලි භාවිතය පිළිබඳව දැනුවත් කිරීම.
5. භාවිත නොකරන අවස්ථාවල උපකරණ ක්‍රියාවිරහිත කිරීම. (අනවශ්‍යය විදුලි උපකරණ අක්‍රිය කිරීම.)

(කරුණු 2කට ලකුණු 1 x 2 = ලකුණු 2)

(ආ) 1. සමාජ තිරසර සංවර්ධනය

ඕනෑම ව්‍යාපාරයක් පරිසරය ආරක්ෂා කිරීමට නැඹුරු වීම.

උදා :- ජල දූෂණය අවම කිරීම

පරිසර සම්බන්ධ උදාහරණවලට ලකුණු දෙන්න.

2. පරිසර තිරසර සංවර්ධනය

පුද්ගල හා පුද්ගල සම්බන්ධතා තුළින් යහපත් මානව සමාජ සම්බන්ධතා පවත්වාගෙන යාම.

උදා :- දුගීබව තුරන් කිරීම

3. ආර්ථික තිරසර සංවර්ධනය

කාර්යක්ෂම සම්පත් භාවිතයයි.

උදා :- අපද්‍රව්‍යය අවම කිරීම

ලාභය, නීතිරීතිවලට අනුගත වීම, යහපාලනය, අවදානම් කළමනාකරණය.

(නම් කර විස්තර කිරීමට 1/2 x 2 = ලකුණු 01
උදාහරණ එකකට 1/2 x 2 = ලකුණු 01)

(iii) (අ) 1890 හවුල් ව්‍යාපාර පනතට අමතරව, ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර සඳහා බලපාන වෙනත් පනත් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සමූපකාර ව්‍යාපාර ක්ෂේත්‍රයේ දැකිය හැකි ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 02 යි)

(අ) 1. 1840 අංක 07 දරන වංචා වැලැක්වීමේ ආඥා පනත (2022 අංක 30)

2. 1987 අංක 07 දරන ව්‍යාපාර නාම පනත / 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත

3. සිවිල් නීති සංග්‍රහය (වගන්ති 64, 202, 249, 252)

4. 2007 අංක 07 දරන සමාගම් පනත

(කරුණු 2කට 1 x 2 = ලකුණු 2)

(ආ) 1. ස්වාධීන සංවිධානයක් වීම.

2. ස්වේච්ඡාවෙන් එක්වූ පුද්ගල සමූහයක් සිටීම.

3. සාමාජිකයින්ගේ සාමූහික අයිතිය

4. පොදු අවශ්‍යතා හා අපේක්ෂාවලින් යුතු වීම.

5. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහිත ව්‍යාපාරයක් වීම.

6. කොටස්වල ආගය වෙනස් නොවී පැවතීම. (කොටසක අගය රු. 100)

7. එක් සාමාජිකයකුට එක් ඡන්දයක් පමණක් හිමි වීම.

8. උපයන අතිරික්තය සාමාජිකයා සමිතිය සමඟ කළ ගණුදෙනුවල වටිනාකම අනුව සාමාජිකයින්ට ලබා දීම.

9. ලාභය මූලික අරමු නොවීම.

(කරුණකට 1/2 බැගින් 1/2 x 4 = ලකුණු 2)

2. (i) 'ලෝකයේ බහුලව පවතින ව්‍යාපාර ක්‍රමයක් ලෙස වරලත් ව්‍යාපාර දැක්විය හැක.'

(අ) මෙම ව්‍යාපාර ක්‍රමය තුළින් වරලත්හිමියාට අත්වන වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ව්‍යාපාර ක්‍රමය තුළින් වරලත්ලාභියාට අත්වන අවාසි දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(i) (අ) 1. ඔහුගේ අයෝජනයකින් තොරව ව්‍යාපාර පුළුල් කිරීමට හැකියා ලැබීම.

2. ප්‍රචාරණ වියදම් වරලත් ලාභියා සමඟ බෙදා ගත හැකි වීම.

3. වරලත්ලාභියාගේ අයෝජනයෙන් ප්‍රතිලාභ ලැබිය හැකි වීම.

4. වරලත්ලාභියාගේ කාර්යක්ෂමතාව මත නිරායාසයෙන්ම ප්‍රතිලාභ ලැබිය හැකි වීම.

5. වරලත්ලාභියා මඟින් පෝෂණය වීම.

6. සන්නාම පිළිබඳ දැනුවත් භාවය වැඩි වීම.

7. ප්‍රාග්ධනය ලබා ගත හැකි වීම.

8. සේවක සුපරීක්ෂණය අවම වීම.

(වාසි 02 කට 1 x 2 = ලකුණු 02)

(ආ) 1. වරලත්හිමියාගේ පාලනයක් ඇති නිසා වරලත්ලාභියාට පූර්ණ ස්වාධීනත්වයක් හිමි නොවීම.

2. වරලත් ව්‍යාපාර ක්‍රමය ලබා ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වීම.

3. ලාභය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් පැවතිය හැකි වීම.

4. වරලත්හිමියාගේ කීර්තිනාමය මත රැඳෙන නිසා අයෝජනය පිළිබඳ අවදානමක් පැවතීම.

5. වරලත් ගිවිසුමට අනුව කටයුතු කිරීමට සිදුවන නිසා වරලත්ලාභියා දැඩි පීඩනයකට හසු වීම.

(අවාසි 02කට 1 x 2 = ලකුණු 02)

(ii) (අ) ආචාරධර්ම සහ නීති අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) තිරසර සංවර්ධනයේ මූලික පදනම් දෙකක් උදාහරණය බැගින් සපයමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ)

| නීති | ආචාරධර්ම |
|---|---|
| 1. නිසිරිති හා රෙගුලාසි පනවයි | 1. සමාජය විසින් පිළිගනු ලබන ආචාරධර්ම හා සමාජයක අනුගතවූ සදාචාරාත්මක මූලධර්ම. |
| 2. නීතිය කඩ කිරීමෙන් උසාවිය මඟින් දඬුවම හිමි වේ. | 2. ආචාරධර්ම කඩකිරීමෙන් ~~උසාවිය හා සදාචාරාත්මක මඟින් දඬුවම් ලැබේ.~~ |
| 3. ව්‍යවස්ථාදායකය මඟින් නීති සකසයි. | 3. සමාජය මඟින් ආචාරධර්ම බිහිවේ. |
| 4. අධිකාරය මඟින් නීති වෙනස් කළ හැක. | 5. සමාජ සාරධර්ම මත ආචාරධර්ම වෙනස් කළ හැක |
| 5. නීතිය විෂයබද්ධය. | 6. ආචාරධර්ම පුද්ගලබද්ධය. |
| 6. නීතිය අනිවාර්යයෙන් ලිඛිත විය යුතු ය. | 7. ආචාරධර්මය ලිඛිත නොවීම. |
| 7. නීතිය සාමාන්‍යයෙන් පොදුය. | 8. ආචාරධර්ම පොදු නැත. |
| 8. නීතිය ප්‍රතික්‍රියාශීලිය | 10. ආචාරධර්ම පූර්ව ක්‍රියාශීලි වීම. |

(වෙනස්කම් 2කට ලකුණු 1 x 2 = ලකුණු

(iv) (අ) සීමාසහිත පොදු සමාගම්වල වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකාවේ 2007 අංක 17 දරණ සමාගම් පනතට අනුව ලැයිස්තුගත සහ පුද්ගලික සමාගම්වල ව්‍යාපාර නාමයන්හි අන්තර්ගත විය යුතු අනිවාර්ය නියමය දක්වන්න. (ලකුණු 02 යි)

(අ)
1. කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම.
2. කොටස් අයිතිය නිදහසේ පැවරිය හැකි වීම.
3. නීතිමය සීමාවන් දැඩි වීම. හෝ ආරක්ෂාව වැඩිවීම.
4. වංචා සිදුවීම අවම වීම.
5. විශාල ප්‍රාග්ධනයක් රැස් කර ගත හැක.
6. යහපාලන පරිචයන් පැවතීම.
7. කොටස් වෙළඳපලට සම්බන්ධ විය හැකි වීම.

(වාසි 1කට 1/2 බැගින් 1/2 x 4 = ලකුණු 2)

(ආ)
1. ලැයිස්තු ගත සමාගම්වල වරහන් තුළ (පොදු) යන වචනය යෙදිය යුතු ය. (PLC)
2. සීමිත පෞද්ගලික සමාගම්වල වරහන් තුළ (පෞද්) වචනය තිබිය යුතු ය. (PVT)

(නම් කිරීමට ලකුණු 1 බැගින් 1 x 2 = ලකුණු

(v) 'රාජ්‍ය අංශයේ ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම' යන්න නිර්වචනය කර, ඒ තුළින් රජයක් ඉටු කර ගැනීමට බලාපොරොත්තුවන අරමුණු හතරක් දක්වන්න.

(ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

ව්‍යාපාරයන්හි ව්‍යුහය හා ක්‍රියාවලීන් චේතනාන්විතව වෙනස් කිරීම ප්‍රතිව්‍යුහගත කිරීම වේ.

හෝ

රාජ්‍ය අංශයේ ව්‍යාපාරවල අයිති, ව්‍යුහය, සම්පත් භාවිතය කාර්යක්ෂම කිරීමට වියදම් කපාහරිමින් ව්‍යාපාරවල අයිතිය, ව්‍යුහය හා ක්‍රියාවලීන් වෙනස් කිරීමයි.

(මෙම අදහස ඇතුළත් පිළිතුරට ලකුණු 2)

අරමුණු

1. රාජ්‍ය අයවැය මත බර අඩු කිරීම තුළින් අරමුදල් සම්පාදනය කිරීම.
2. තරඟකාරීත්වය හා කාර්යක්ෂමතාව වැඩි කිරීම.
3. තාක්ෂණික නවීකරණය
4. යහපත් පාරිභෝගික / මහජන සේවාවන් ලබා දීම.
5. කොටස් අලෙවිය මගින් හිමිකාරත්වය පුළුල් කිරීම.
6. ව්‍යාපාර සංස්කෘතියක් බිහි වීම.
7. යහපත් පාලනයක් ඇති වීම.

දිගු කාලීනව වත්කම් හා සේවාවන් ආයෝජකයන් හට භාරදීමට හැකිවීම

ආයෝජකයන් ආකර්ෂණය

(ලකුණු 1/2 බැගින් කරුණු 4කට 1/2 x 4 = ලකුණු 2)

3. (i) (අ) චෙක්පතක් රේඛනය කළ හැකි පාර්ශ්ව හතරක් සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

(ආ) චෙක්පතක් 'ගනුදෙනු කළ නොහැක' ලෙස රේඛනය කිරීමෙන් ඇතිවන නෛතික බලපෑම කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 02 යි)

(i) (අ) අණකරු

අණලද්දා

ආදායකයා

ධාරකයා

(ලකුණු 1/2 බැගින් කරුණු 4කට 1/2 x 4 = ලකුණු 2)

(ආ) එම චෙක්පතක් පවරන්නාට තිබෙන අයිතියට වඩා වැඩි අයිතියක් පැවරුම්ලාභියාට නොලැබෙන බවයි.

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)

(ii) (අ) ගිණුම් හිමියකුට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM) තුළින් ලබාගත හැකි සේවා හතරක් ලියන්න.

(ලකුණු 02 යි)

(ආ) පහත සඳහන් දෑ අතුරෙන් එකක් පමණක් කෙටියෙන් විස්තර කරන්න.

(1) විශාල දත්ත (big data)

(2) විද්‍යුත් මුදල් (e-money)

(ලකුණු 02 යි)

(ii) (අ)

1. මුදල් ආපසු ගැනීම.
2. මුදල් තැන්පතු කිරීම.
3. මුදල් ගිණුමකින් ගිණුමට මාරු කිරීම.
4. ගිණුමේ ශේෂය දැන ගත හැකි වීම.
5. බිල්පත් ගෙවීම
6. PIN අංකය වෙනස් කළ හැකි වීම.
7. ලුහුඬු සාරාංශයක් ලබා ගත හැකිය.

(කරුණකට ලකුණු 1/2 x 4 = ලකුණු 2)

(ආ) <u>Big data</u>

විවිධත්වය, ප්‍රමාණය හා වැඩි ප්‍රවේශයක් සහිත දත්ත සමුදාය මෙමගින් අදහස් වේ. ඉහළ විවිධත්වයකින්, වේගවත්ව, පුළුල් පරිමාවක් සහිත දත්ත සමුදාය ලෙස හැඳින් වේ. ( $V_3$ = Variety, Volume and Velocity විවිධ, පරිමාණ හා වේගවත්)

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 2)

විද්‍යුත් මුදල් (E-Money)

තොරතුරු තාක්ෂණයේ හා ඩිජිටල් තාක්ෂණයේ දියුණුව සමග හඳුන්වා දුන් පරිගණක ජාලයක් මගින් ගණුදෙනු සිදුවන ක්‍රමයකි.

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 2)

(iii) (අ) ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා රජය මගින් ලබාදෙන මූල්‍ය නොවන සේවා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'නිර්මාණශීලිත්වය ව්‍යවසායකයකු සතු මූලික ගුණාංගයකි.' මෙම ගුණාංගයෙහි වැදගත්කම උදාහරණයක් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(අ)
1. උපදේශන සේවා
2. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
3. පර්යේෂණ හා තාක්ෂණික සේවා
4. යටිතල පහසුකම් සැපයීම
5. වෙළෙඳපල පහසුකම්/ අලෙවි පහසුකම්
6. විශිෂ්ටතා සම්මාන ලබා දීම.

(කරුණු 2ට, ලකුණු 2)

(ආ) වෙනස් ආකාරයකට දැකීම, සිතීම හා ක්‍රියා කිරීම නිර්මාණශීලි බවයි.

උදා :-
- නව ව්‍යාපාර ආකෘති
- නව ව්‍යාපාර සැලසුම් කිරීම.
- නව ගෙවීම් මාර්ග
- නව පාරිභෝගික බෙදා හැරීමේ මාර්ග

(විස්තර කිරීමට ලකුණු 1, උදාහරණයට ලකුණු 1)

(iv) 'ව්‍යවසායකත්වය රටක සංවර්ධනයේ ජීවනාලිය ලෙස පිළිගැනේ.' එසේ පිළිගැනීමට හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

1. ආර්ථික වර්ධනය වේගවත් කිරීම.
2. නවෝත්පාදන වර්ධනය කිරීම.
3. සමාජයේ වෙනස්වීම වර්ධනය
4. කාර්මික සංවර්ධනය
5. පවත්නා ව්‍යාපාර දියුණුව හා වර්ධනය (දේශීය / විදේශීය)
6. ඵලදායිතාව වර්ධනය වීම.
7. රැකියා උත්පාදනය
8. නව ආදායම් මාර්ග බිහිවීම.
9. සැපයුම් දාමයේ ඉහළ හා පහළ කර්මාන්තවල වර්ධනය

(කරුණකට ලකුණු 1 බැගින් 1x 4 = ලකුණු 04)

(v) ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා සහ මාධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්තමානයේ දී මුහුණපාන අභියෝග හතරක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. මූල්‍ය ගැටළු / බැංකු ණය අනුමත වීම අපහසු වීම
2. වෙළෙඳපොළ තරගකාරිත්වයට මුහුණ දීමට අපහසු වීම.
3. කළමනාකරණයේ දුර්වලතා
4. ව්‍යවසායකත්ව හැකියා අඩුවීම.
5. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම. / ප්‍රවාහන පිරිවැය ඉහළ යාම
6. නව තාක්ෂණික දැනුම අඩුකම.
7. නව තාක්ෂණය යොදා නොගැනීම.
8. බදු වැඩිවීම

(කරුණු 4කට ලකුණු 04)

9. විනිමය ගාස්තු ... /10. ආනයන සීමා කිරීම හා ආනයන ගාස්තු ඉහළ යාම



11. විදුලි හා ඉන්ධන මිල ඉහළ යාම.

4. (i) (අ) ජීවිත රක්ෂණය සහ සෞඛ්‍ය රක්ෂණය අතර පවතින වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) කුලී නිවැසියෙකුට එම නිවස රක්ෂණය කළ හැකි ද යන්න සඳහන් කර, ඔබගේ පිළිතුරට පදනම් වන රක්ෂණ මූලධර්මය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(i) (අ)

| ජීවිත රක්ෂණය | සෞඛ්‍යය රක්ෂණය |
|---|---|
| 1 රක්ෂිතයා මියගිය විට රක්ෂිත මුදල ගෙවනු ලැබේ. | රක්ෂිතයාට ආපදාවකට පත්වූ රෝහල් ගතවූවහොත් පමණක් වන්දි ගෙවයි. |
| 2 දිගුකාලීන වේ. | සාපේක්ෂව කෙටිකාලීන වේ. |
| 3 රක්ෂිතයා මියගිය විට/රක්ෂිත ඔප්පුව කල්පිරුණු විට යැපෙන්නන්ට හෝ රක්ෂිතයාට ප්‍රතිලාභ ලැබේ. | මූල්‍ය ප්‍රතිලාභ රක්ෂිතයාට පමණක් ගෙවනු ලැබේ. |
| 4 හානිය නිශ්චිත වේ. | හානිය නිශ්චිතනොවේ. |
| 5 රක්ෂණ ඔප්පුව උකසට තබා ණයක් ලබා ගත හැක. | රක්ෂණ ඔප්පුව උකසට තැබිය නොහැක. |

(කරුණකට ලකුණු 1 බැගින් 1 x 2 =ලකුණු 2)

(ආ) රක්ෂණය කළ නොහැක. (ලකුණු 01)

රක්ෂණ හිමිකමක් නොමැති වීම නිසා (ලකුණු 01)

(ii) (අ) ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) කාර්ය හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයුම් වර්ධනය කිරීම සඳහා යොදාගත හැකි උපායමාර්ග හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

(අ)
1. වෙළෙඳ ගිවිසුම් පරිපාලනය
2. ජාතික වෙළෙඳ ප්‍රතිපත්ති අධීක්ෂණය කිරීම හා ඇගයීම.
3. ජාත්‍යන්තර වෙළෙඳාම ලිහිල් කිරීම/ ආරවුල් විසඳීම.
4. නිදහස් වෙළෙඳාමට ඇති බාධා අවම කිරීම
5. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා තාක්ෂණික සහාය හා පුහුණුව ලබාදීම.
6. අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
7. සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ ධාරිතාවයන් ගොඩනැගීම.
8. වෙළෙඳ ගණුදෙනුවල විනිවිදභාවය දිරි ගැන්වීම.
9. සාමාජික රටවල ජනතාවගේ සුබසාධනය නංවාලීම.

(කරුණකට ලකුණු 1/2 බැගින් 1/2 x 4 =ලකුණු 2)

(ආ)
1. තාක්ෂණික සහාය ලබාදීම.
2. නව වෙළෙඳපොළ සොයා දීම.
3. අපනයන ක්‍රියාවලිය සරල කිරීම.
4. භෞතික යටිතල පහසුකම් වර්ධනය කිරීම.
5. අපනයන මූල්‍ය පහසුකම් පුළුල් කිරීම.
6. ද්වි පාර්ශවික හා බහු පාර්ශවික වෙළෙඳ ගිවිසුම් වර්ධනය කිරීම
7. අපනයනකරුවන්ට මූල්‍ය හා මූල්‍ය නොවන දිරිගැන්වීම් ලබා දීම.
8. ජාත්‍යන්තර වෙළෙඳ සල්පිල් හා ප්‍රදර්ශනවලට සහභාගි වීම.
9. විවිධ බදු සහන ලබා දීම.
10. ආයතනික පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.

(කරුණකට ලකුණු 1/2 බැගින් 1/2 x 4 =ලකුණු 2)

(iii) (අ) පහත දැක්වෙන ක්‍රම කාර්යය සම්පාදන/ප්‍රවාහන හා සැපයුම් සේවා (logistics) මාර්ග අතුරෙන් එකක් උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න.

(1) ආපසු ක්‍රම කාර්යය සම්පාදනය (reverse logistics)

(2) තෙවන පාර්ශ්වීය ක්‍රම කාර්යය සම්පාදනය (3 PL)

(ලකුණු 02 යි)

(ආ) විධිමත් ඇසුරුම් හා උපකරණ භාවිතයෙන් ගබඩාකරණයේ දී ව්‍යාපාරිකයකුට ලබාගත හැකි ප්‍රයෝජන හතරක් දක්වන්න.

(ලකුණු 02 යි)

(අ) 1. නිෂ්පාදිත අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහය සහිත පද්ධති

උදා -

- ගෑස් සිලින්ඩර වැනි ආපසු භාරදෙන ඇසුරුම්
- භාවිත කළ ද්‍රව්‍ය ඉවත ලෑම.
- විකුණුම්කරුට හෝ නිශ්පාදකයාට ආපසු භාණ්ඩ භාර දීම.

(පැහැදිලි කිරීමට ලකුණු 01, උදාහරණයට ලකුණු 01)

2. ඇතැම් ව්‍යාපාර කටයුතු බාහිර පාර්ශවයන්ට ලබා දීම. (Third party Logistics)

උදා :-

- ආරක්ෂක ඒකක
- පිරිසිදු කිරීමේ සේවා
- ප්‍රවාහන සේවා
- නඩත්තු සේවා
- නීතිමය කටයුතු
- ගිණුම්කරණ කටයුතු

(පැහැදිලි කිරීමට ලකුණු 01, උදාහරණයට ලකුණු 01)

(ආ) 1. ආරක්ෂිතව ගබඩා කළ හැකි වීම.

2. විධිමත් ආකාරයට එහා මෙහා ගෙන යාම කාර්යක්ෂම වීම./ගබඩාව වඩාත් සංවිධාන වීම.

3. ගබඩාවේ ඇති ද්‍රව්‍යය සොයා ගැනීම පහසු වීම.

4. ගබඩා ඉඩකඩවලින් උපරිම ප්‍රයෝජන ගැනීම

5. ඵලදායිතාව වර්ධනය

6. පිරිවැය අවම කිරීම

7. නාස්තිය හා අපතේ යාම අඩුවීම.

8. සේවක ආරක්ෂාව තහවුරු වීම.

(කරුණකට ලකුණු 1/2 බැගින් 1/2 x 4 = ලකුණු 2)

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ පවතින අර්බුදකාරී තත්ත්වය ව්‍යාපාරික හා පාරිභෝගික පාර්ශ්වයන්ට බලපාන ආකාර දෙක බැගින් සඳහන් කරන්න.

(ලකුණු 04 යි)

ව්‍යාපාරවලට

1. භාණ්ඩවල මිල ඉහළ යාම
2. සේවක පැමිණීම දුර්වල වීම.
3. භාණ්ඩ බෙදා හැරීමේදී ගැටලු මතු වීම.
4. අමුද්‍රව්‍ය කලට වේලාවට සැපයීම ප්‍රමාද වීම.
5. උපකාරක සේවා සැපයීම ප්‍රමාද වීම.
6. සේවක ඵලදායිතාව හීන වීම.

පාරිභෝගිකයින්ට

1. පාරිභෝගික වියදම ඉහළ යාම
2. ජීවන තත්ත්වය අඩාල වීම.
3. ප්‍රවාහන අපහසුතා මතු වීම.
4. කලට වේලාවට පැමිණීමට නොහැකි වීම.
5. ගුණාත්මක භාණ්ඩ පරිහරණයට ඇති අවස්ථා අහිමි වීම.
6. භාණ්ඩ හිඟ වීම.

(කරුණකට ලකුණු 1 බැගින් කරුණු 1 x 2 =ලකුණු 2)

(v) ව්‍යාපාරිකයකු විසින් සමාජ මාධ්‍යය හරහා සන්නිවේදනය සිදු කිරීමට පක්ෂව සහ විපක්ෂව හේතු දෙක බැගින් විස්තර කරන්න.

(ලකුණු 04 යි)

පක්ෂව

1. පාරිභෝගික ආකර්ෂණය හා පක්ෂපාතිත්වය වර්ධනය වීම.
2. පාරිභෝගික ප්‍රතිචාරය ලබා ගැනීම පහසු වීම.
3. පිරිවැය අඩුවීම.
4. විදේශීය හා දේශීය වෙළෙඳපොල පුළුල් වීම.
5. වෙළෙඳපොල පර්යේෂණය පහසු වීම.
6. ව්‍යාපාර අදහස් හුවමාරු කිරීමට පහසු වීම.
7. සේවකයන් ආකර්ෂණය පහසුවීම.
8. පාරිභෝගික සම්බන්ධතා ඉහළ නැංවීම.

විපක්ෂව

1. අමතර සම්පත් අවශ්‍යය වීම.
2. දෛනික අධීක්ෂණය අවශ්‍ය වීම.
3. සමාජ මාධ්‍යවල අනිසි හැසිරීම බලපෑයි.
4. සෘණාත්මක ප්‍රතිචාරයන් ඇති වීම.
5. තොරතුරු අනවසරයෙන් ලබා ගැනීම.
6. අවශ්‍යය පුද්ගලයන්ට තොරතුරු නොලැබීමත් අනවශ්‍යය පුද්ගලයන්ට තොරතුරු ලැබීමටත් ඇති හැකියාව
7. ව්‍යාපාරික රහස්‍යභාවය ආරක්ෂා නොවීම.

(කරුණකට ලකුණු 1 බැගින් 1 x 2 = ලකුණු 2)

## II කොටස

5. සමනි වෙල්ත්වයිල්ස් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී, ව්‍යාපාරයේ උන්නතිය සඳහා නිර්මාණශීලී චින්තනය සඳහන්කිරීමේ අවධානය දක්වයි. එසේ ම ඇය සේවකයන් සමග ඵලදායී සංවාද පවත්වන්නිය අතර ඉඩ ලද සෑම අවස්ථාවක ම සේවකයින්ගේ උත්සවවලට ආයතනය නියෝජනය කරමින් සහභාගී වේ. තව ද ආයතනයේ අභ්‍යන්තර හා බාහිර පාර්ශ්ව සමග ඇය යහපත් සබඳතා පවත්වයි.

(i) (අ) ඉහත සිද්ධිය තුළින් හඳුනාගත හැකි කළමනාකරුවකු සතු ප්‍රධාන කළමනාකරණ භූමිකා වර්ග දෙක මොනවා ද? (ලකුණු 02 යි)

(ආ) ඉහත (අ) කොටසෙහි හඳුනාගත් එක් එක් ප්‍රධාන භූමිකාවට අදාළ ව සිද්ධියෙහි ඇතුළත් උප භූමිකා දෙක බැගින් ලියන්න. (ලකුණු 02 යි)

(i) (අ) 1. අන්තර් පුද්ගල භූමිකාව

2. තොරතුරු භූමිකාව (කරුණු 1 x 2 = ලකුණු 2)

3. තීරණ භූමිකාව

(ආ) අන්තර් පුද්ගල භූමිකාව

1. ආයතන ප්‍රධානියා

2. සබඳතා පවත්වන්නා

තොරතුරු භූමිකාව

1. නියාමක

2. මාධ්‍ය ප්‍රකාශකයා (එකකට ලකුණු 1/2 බැගින් 1/2 x 4 = ලකුණු 02)

තීරණ භූමිකාව < ව්‍යවසායකයා / බාධා සමනය කරන්නා

(ii) (අ) ගිහාන් සතුව පැවතිය යුතු ප්‍රමුඛ කළමනාකරණ කුසලතාවය නම් කර, ඔබේ පිළිතුරට හේතු දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ගිහාන් තම ආයතනය සඳහා මෙහෙවර ප්‍රකාශයක් පිළියෙල කිරීමට අදහස් කරන්නේ නම් එහි ඇතුළත් විය යුතු සංරචක හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

(අ) සංකල්පනාත්මක කුසලතා/මනෝභාවාත්මක කුසලතා

(ලකුණු 01)

හේතු :- 1. සමස්ථ ආයතනය සම්බන්ධව අවබෝධයක් තිබීම.

2. ආයතනය සම්බන්ධව අනාගත තීරණ ගැනීමට හැකියාව තිබීම.

3. හැටලු පේරුම් ගැනීමට හා විසඳීමට ඇති හැකියාව.

4. තීක්ෂණව සිතීමේ හැකියාව

5. ක්‍රියාවලියක් ලෙස විස්තර කිරීමේ හැකියාව

(හේතු එකකට ලකුණු 1/2 බැගින් දෙකකට ලකුණු 01)

(ආ) 1. ඉලක්ක ගණුදෙනුකරුවෝ

2. නිෂ්පාදිතයේ ස්වාභාවය

3. ඉලක්ක වෙළෙඳපල

4. තාක්ෂණය

5. වටිනාකම්, විශ්වාස හා දර්ශනය

6. ව්‍යාපාරයේ සුවිශේෂ බව

7. මහජන ප්‍රතිරූපය

8. සේවකයෝ

9. පැවැත්වීම, වර්ධනය හා ලාභදායිතාවය

(කරුණකට 1/2 බැගින් 1/2 x 4 =ලකුණු 02)

(iii) 'ගිහාන් සේවක අභිමුඛ නායකයකු ලෙස සේවකයන් අතර ප්‍රචලිත ය.'

(අ) 'සේවක අභිමුඛ නායකත්ව ශෛලිය' නිර්වචනය කර, එහි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ගිහාන් තීරණ ගැනීමේ අධිකාරිත්වය විමධ්‍යගත කිරීමට අදහස් කරයි. නම් ඒ තුළින් ව්‍යාපාරයට අත්වන ප්‍රතිලාභ හතරක් ලියන්න. (ලකුණු 02 යි)

(iii) (අ) සේවකයන් පාලනය කිරීමට වඩා ඔවුන් අභිප්‍රේරණය කිරීමට වැඩි අවධානයක් යොමු කරන නායකත්වය සේවක අභිමුඛ නායකත්වයයි.

(නිර්වචනයට ලකුණු 01)

1. සේවකයන් සමඟ මිත්‍රශීලිය
2. සේවකයන් විශ්වාස කරයි.
3. ගෞරවාන්විතව සම්බන්ධතාව පවත්වා ගෙනයයි.
4. තීරණ ගැනීමේදී සේවක සහභාගිත්වය ලබා ගනී.
5. සේවක හැකියාවන් හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිලාභ ලබා ගැනීම.
6. සේවකයන් අතර ධනාත්මක සබඳතා පවත්වා ගනී.
7. සේවකයන්ට මඟ පෙන්වයි.
8. සේවක අදහස්, ගැටලු විවෘතව සාකච්ඡා කළ හැකිය.

(කරුණකට ලකුණු 1/2 බැගින් 1/2 x 2 = ලකුණු 1)

(ආ)
1. ඉහළ කළමනාකරණයේ කාර්යභාරය අඩුවීම.
2. ගුණාත්මක තීරණ ගත හැකි වීම.
3. පහසුවෙන් තීරණ ක්‍රියාවට නැංවීමට හැකියාව
4. යටත් සේවකයන් සංවර්ධනය වීම.
5. සේවක අභිප්‍රේරණය ඉහළ යාම හා තෘප්තිය වර්ධනය වීම.
6. සන්නිවේදනය කාර්යක්ෂම වීම.
7. සුපරීක්ෂණය හා පාලනය පහසු වීම.
8. මිනිස් අවශ්‍යතා තෘප්තිමත් කිරීම

(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4ට ලකුණු 02)

(iv) පහතින් දැක්වෙන්නේ සමගි ටෙක්ස්ටයිල්ස් හි යෙදවුම් හා නිමැවුම් වලට අදාළ දත්ත කිහිපයකි.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | - | ඒකක 5 000 |
| ශ්‍රමය | - | පැය 2 500 |
| යන්ත්‍ර | - | පැය 4 000 |
| බලශක්ති පිරිවැය | - | රු.150 000 |
| ශ්‍රම පිරිවැය | - | පැයකට රු.100 |
| යන්ත්‍ර පිරිවැය | - | පැයකට රු.25 |
| අමුද්‍රව්‍ය පිරිවැය | - | ඒකකයකට රු.10 |
| මුළු නිමැවුම් | - | ඒකක 300 000 |

(අ) පහත දෑ ගණනය කරන්න.

(1) ශ්‍රම ඵලදායීතාවය (ලකුණු $\frac{1}{2}$ යි)

(2) යන්ත්‍ර ඵලදායීතාවය (ලකුණු $\frac{1}{2}$ යි)

(3) මුළු ඵලදායීතාවය (ලකුණු 01 යි)

(ආ) යන්ත්‍ර ඵලදායීතාවය වර්ධනය කර ගැනීම සඳහා ව්‍යාපාරයට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ශ්‍රම ඵලදායිතාවය $= \frac{\text{නිමවුම}}{\text{ශ්‍රම පැය ගණන}}$

$= \frac{300000}{2500}$

$= 120$ (ලකුණු 1/2)

යන්ත්‍ර සූත්‍ර ඵලදායිතාවය $= \frac{\text{නිමවුම}}{\text{යන්ත්‍ර සූත්‍ර යෙදවුම}}$

$= \frac{300000}{4000}$

$= 75$ (ලකුණු 1/2)

මුළු ඵලදායිතාවය $= \frac{\text{නිමවුම}}{\text{යෙදවුම}}$

$= \frac{300,000}{550,000}$

$= 0.545$ (ලකුණු 1)

(අවසන් පිළිතුරු නොතිබුණද ලකුණු 01 දෙන්න.)

(ආ) 1. දියුණු තාක්ෂණික උපකරණ සහිත යන්ත්‍ර යොදා ගැනීම.
2. අබලන් නොවූ යන්ත්‍ර යොදා ගැනීම.
3. නිසි පරිදි නඩත්තු කිරීම.
4. බාධක හඳුනා ගැනීම.
5. යන්ත්‍ර සූත්‍ර නිසි පරිදි යාවත්කාලීන කිරීම
6. ධාරිතාව වර්ධනය කිරීම.
7. ස්වයංක්‍රියකරණය

(කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2ට ලකුණු 02)

(v) ගිහාන්ගේ ව්‍යාපාරය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පාලන ක්‍රියාවලියට ඇතුළත් කළ යුතු පියවර නම් කර, ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. ප්‍රමිත ස්ථාපිත කිරීම.
2. කාර්ය ඵල මැනීම.
3. ප්‍රමිත හා කාර්යඵල සැසඳීම.
4. ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම.

(නම් කිරීමට (1/2 x 4) ලකුණු 02, විස්තර (1/2 x 4) කිරීමට ලකුණු 02)

6. රසාංජලී ආයතනය තත්ත්වයෙන් උසස් බිස්කට් නිෂ්පාදනයේ නියැලී සිටී. මෙම ආයතනයට අලුතින් බඳවාගත් අලෙවිකරණ කළමනාකරු විසින් වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීමේ සහ අලෙවි ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව ඉහළ කළමනාකරණයට අවධාරණය කරයි. තව ද, මෙම නිෂ්පාදන සඳහා යෝග්‍ය ඇසුරුමක අවශ්‍යතාවය ද පෙන්වා දෙයි.

(i) (අ) සඵලදායී වෙළෙඳපොළ ඛණ්ඩනයක් සඳහා තිබිය යුතු අවශ්‍යතා හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීම තුළින් ව්‍යාපාරයට ලබාගත හැකි වාසි දෙකක් උදාහරණ සහිත ව සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(i) (අ)

1. මැනිය හැකි විම
2. ළඟා විය හැකි විම
3. ප්‍රමාණවත් බව
4. වෙන් කොට හඳුනාගත හැකි විම
5. ක්‍රියාත්මක කළ හැකි බව

(කරුණකට 1/2 බැගින් ½ x 4 = ලකුණු 02)

(ආ)

1. සමස්ථ වෙළඳපොළම විශ්ලේෂණයට භාජනය කෙරෙන නිසා වෙළඳපොළ පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි විම
2. උචිත හා කාලීන වෙළඳපොළ අවස්ථා හඳුනාගත හැකි වීම
3. ආයතනය සතු සම්පත් සඵලදායී හා කාර්යක්ෂම ලෙස යොදා ගැනීමට හැකිවීම
4. ආයතනයට වෙළඳපොළ පිළිබඳ ඇති අවධානය අවම කර ගත හැකි විම
5. අලෙවිකරණ වැඩසටහන් වඩාත් සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි බව
6. නව නිෂ්පාදිතය ප්‍රවර්ධනය
7. වඩාත් සඵලදායීව අලෙවිකරණ නිර්මාණයන් කළ හැකි විම.
8. ඉතා යෝග්‍ය පාරිභෝගික සේවාවක් සැපයීම
9. පාරිභෝගික අභිමුඛ සංස්කෘතියක් වර්ධනය කිරීම

(කරුණකට 1 බැගින් 1 x 2 = ලකුණු 02)

(ii) (අ) බිස්කට් සඳහා ඇසුරුමක් නිර්මාණය කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) බිස්කට් සඳහා අව-අලෙවිකරණයක් (de-marketing) පවතී නම් එය මඟහරවා ගැනීම සඳහා අලෙවිකරණ කළමනාකරුවකුට යොදාගත හැකි උපායමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ)

1. නිෂ්පාදිතයේ ස්වභාවය
2. ඇසුරුමෙන් නිෂ්පාදිතයට ලැබෙන ප්‍රයෝජන
3. තාක්ෂණික යෝග්‍යතාව
4. ඇසුරුමේ අංග
5. වෙළෙන්දාට ඇති පහසුව
6. පාරිභෝගිකයාට ඇති පහසුව හා ප්‍රයෝජන
7. පරිසර හිතකාමී බව
8. ඇසුරුම් සඳහා වැය වන පිරිවැය

9. [illegible]

(කරුණකට 1/2 බැගින් ½ x 4 = ලකුණු 02)

(ආ)

1. ප්‍රවර්ධනය
2. ව්‍යාපාරික සමාජ වගකීම
3. දැනුවත් කිරීමේ වැඩසටහන්
4. ප්‍රචාරණය
5. නැවත නිර්මාණය
6. සන්නම අළුත් කිරීම

(කරුණකට 1/2 බැගින් ½ x 4 = ලකුණු 02)

(iii) භාණ්ඩ වර්ගීකරණයට අනුව බිස්කට් අයත් වන්නේ කුමන භාණ්ඩ වර්ගයට දැයි දක්වා, ඊට වඩාත් ගැළපෙන බෙදාහැරීම් උපායමාර්ගය හා ප්‍රවර්ධන උපායමාර්ගය හේතු සහිතව දක්වන්න. (ලකුණු 04 යි)

* පාරිභෝගික භාණ්ඩයකි (ලකුණු 02)
* පුළුල් බෙදා හැරීමේ මාර්ගය
  ඕනෑම වෙළෙඳ සැලකින් ලබා ගැනීමට ඇති හැකිය. (ලකුණු 1/2)
* ප්‍රචාරණය
  විශාල පරිභෝගික පිරිසකට ළඟා විය හැකි වීම. (ලකුණු 1/2)

(නම කිරීමට ලකුණු 2)

(iv) (අ) භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම තුළින් ආයෝජකයකුට ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂ බැංකු අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(අ)

1. රජය විසින් භාණ්ඩාගාර බිල්පත්වල පොලිය හා පරිණත වීමෙන් පසුව ගෙවීමට සහතික වීම
2. සුරක්ෂිත ආයෝජනයක් වීම
3. අවදානම ඉතාමත් අඩු වීම
4. ද්විතියික වෙළඳපොළේ ඇලෙවි කළ හැකි වීම
5. ඉහළ ද්‍රවශීලතාවයක් පැවතීම
6. පොලිය මිලදීගත් අවස්ථාවේ දී ම ලැබීම
7. රඳවා ගැනීම බදු අය කර නොගැනීම

(ආ)

(කරුණු 1 කට 1 x 2 = ලකුණු 02)

| බලපත්‍ර ලාභී වාණිජ බැංකු | බලපත්‍ර ලාභී විශේෂිත බැංකු |
|---|---|
| 1. ජංගම ගිණුම් පවත්වාගෙන යයි | 1. ජංගම ගිණුම් පවත්වාගෙන නොයයි |
| 2. විදේශ විනිමය ගණුදෙණු වල නිරත වේ | 2. විදේශ විනිමය ගණුදෙනුවල නිරත නොවේ. |
| 3. අරමුණු වන්නේ මහජන තැම්පතු භාර ගැනීමය | 3. අරමුණු - කාර්මික හා කෘෂිකාර්මික කටයුතු සඳහා අරමුදල් සැපයීම |
| 4. මහබැංකුවේ මුදල් මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු ය | 4. බැංකු පනත යටතේ විශේෂිත බැංකුවක් ලෙස මහ බැංකුවකින් බලපත්‍රයක් ලබා ගත යුතු ය |
| 5. මුදල් මැවීමේ හැකියාව | 5. මුදල් මැවීමේ හැකියාවක් නොමැත. |
| 6. කෙටිකාලීන නැඹුරුවකි | 6. දිගුකාලීන නැඹුරුවකි. |

(වෙස්කම 1 කට ලකුණු 1 x 2 = ලකුණු 02)

(v) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළ වැදගත් වීමට හේතු හතරක් ලියන්න.

(ලකුණු 04 යි)

- පුද්ගලයන් හා ආයතන ආයෝජනය සඳහා දිරි ගැන්වීම.
- ආයෝජකයන්ට විවිධ ප්‍රතිලාභ ලබාගත හැකි වීම.
- සමාගම්වලට විශාල ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම.
- සමාගම්වල කොටස් සඳහා ද්විතියික වෙළෙඳ පොළක් ඇති වීම.
- විදේශ ආයෝජකයන් රට තුළට ආද්දවා ගත හැකි වීම.
- රජයේ සුරැකුම්පත් අලෙවි කිරීමෙන් රජයට අවශ්‍ය අරමුදල් ලබා ගත හැකි වීම.
- සමාගම්වල කොටස්වලට වටිනාකමක් නිර්මාණය වීම.
- සමාගම්වල කීර්තිනාමය හා ප්‍රතිරූපය ඉහළ යාම.

(කරුණු 4කට ලකුණු 4යි.)
(ලකුණු 20)

7. (i) (අ) 'ප්‍රාග්ධන අයවැයකරණය' යන්න කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'මූල්‍ය සම්පාදනයේ දී ව්‍යාපාරයකට බාහිර මූල්‍ය මාර්ග වලට වඩා අභ්‍යන්තර මූල්‍ය මාර්ග වාසිදායක වේ.' මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 02 යි)

(අ) අනාගතයේ දී ප්‍රතිලාභ ඉපැයීමේ අරමුණෙන් ව්‍යාපාර ආයතනයක් සතුව පවතින වර්තමාන අරමුදල් වඩා ඵලදායී ලෙස දිගුකාලීන වත්කම්වල හෝ දිගුකාලීන ව්‍යාපෘතිවල හෝ ආයෝජනය කිරීමට සැලසුම් කිරීම ප්‍රාග්ධන අයවැයකරණයයි.

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)

(ආ) එකඟ වේ. (ලකුණු 01)

1. පිරිවැය අඩුවීම
2. ලබා ගැනීමේ පහසුව
3. ආපසු ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැති වීම
4. ව්‍යාපාරයේ වගකීම් වැඩි නොවීම
5. විශේෂ කොන්දේසිවලට යටත්වීමට සිදු නොවීම
6. හිමිකාරිත්වය හා පාලනය එලෙසින්ම පවත්වා ගෙන යා හැකි වීම
7. ~~අයි-බදු මගහැරීමට නොහැකි වීම~~

( කරුණු 1කට ½ x 2 = ලකුණු 01)

(ii) (අ) සංවේදනා කළමනාකරණය ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) සේවකයකු විසින් විනය විරෝධී ක්‍රියාවක් සිදු කළහොත් සේවා යෝජකයකුට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(අ)

1. සේවක අභිප්‍රේරණය
2. වඩා යෝග්‍ය සේවකයන් අද්දවා ගත හැකි වීම.
3. සේවක කාර්යඵල වැඩි කළ හැකි වීම.
4. සේවක පිරිවැටුම් අඩු කළ හැකි වීම.
5. සේවක ප්‍රවාසිතාව අඩු වීම.
6. සේවක ගරුත්වය වර්ධනය වීම.
7. සේවක පක්ෂපාතිත්වය වර්ධන වීම.

(කරුණු 1කට 1 x 2 = ලකුණු 02)

(ආ)

1. වාචිකව අවවාද කිරීම
2. ලිඛිතව අවවාද කිරීම
3. දඩ ගැසීම හෝ අලාභය අය කර ගැනීම
4. වේතන රහිතව තාවකාලිව වැඩ තහනම් කිරීම
5. විනායනුකූලව සේවා ස්ථානය මාරු කිරීම
6. වැටුප් වර්ධක නතර කිරීම හෝ ප්‍රමාද කිරීම
7. තනතුරෙන් පහත හෙළීම
8. සේවයෙන් ඉවත් කිරීම

(කරුණකට 1/2 බැගින් ½ x 4 = ලකුණු 02)

(iii) (අ) මානව සම්පතෙහි ඇති විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'සේවක පරිවාස කාලය' යන්න නිර්වචනය කර, ඒ තුළින් සේවා යෝජකයාට සහ සේවකයාට ඇති වන වාසිය බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(අ)

1. සජීවී සම්පතක් වීම
2. සිතීමට හා ප්‍රතික්‍රියා දැක්වීමට හැකි වීම
3. සෙසු සම්පත් පාලනය කල හැකි වීම
4. පුහුණු කිරීමෙන් අගය වැඩි වීම
5. කණ්ඩායමක් වශයෙන් කටයුතු කළ හැකි වීම
6. චර්යා සංකීර්ණ වීම හා පුරෝකථනය කළ නොහැකි වීම
7. නිර්මාණාත්මක හැකියා සහිත වීම
8. මූල්‍ය හා මූල්‍ය නොවන මාර්ගවලින් අභිප්‍රේරණය කළ හැකි වීම

(කරුණකට ලකුණු 01 බැගින් 1 x 2 = ලකුණු 02)

(ආ) ස්ථිර තනතුරකට බඳවා ගත් නව සේවකයෙකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර සේවය කළ යුතු කාල පරිච්ඡේදය පරිවාස කාලය වේ.

(ලකුණු 01)

| සේවායෝජකයාට ඇති වාසි | සේවාදායකයාට වාසි |
|---|---|
| 1. සේවකයා වැඩට සුදුසු ද යන්න තීරණය කිරීමට | 1. සේවකයා තවදුරටත් ආයතනයේ රැඳී සිටීමට ඇති කැමැත්ත |
| 2. අළුතින් බඳවාගත් සේවකයා ඇගයීම | 2. වැඩ කරන පරිසරය පිළිබඳඅධ්‍යයනය කිරීම |
| | 3. සුපරීක්ෂකයන් හා සමාන සේවකයන් සමඟ සුහදතාවයක් ඇති කර ගැනීම |

(වාසි 01ට ලකුණු ½) (වාසි 01ට ලකුණු ½ )

(iv) (අ) 'සෑම රැකියාවක් ම මූලිකාංග තුනකින් සමන්විත වේ.'

(1) එම මූලිකාංග තුන නම් කරන්න. (ලකුණු 01 යි)

(2) ඔබ හඳුනාගත් මූලිකාංගවල ඇති අන්තර් සම්බන්ධතාවය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 01 යි)

(ආ) මානව සම්පත් ඉල්ලුම පුරෝකථනය කිරීමේ දී සලකා බැලිය යුතු අභ්‍යන්තර සාධක හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

(අ) (1)

1. කටයුතු
2. රාජකාරි
3. වගකීම

(පිළිතුරු 03 ම ඇත්නම් ලකුණු 01
පිළිතුරු 2 ට ලකුණු ½
එක් පිළිතුරට ලකුණු නැත.)

(2) බලතලවලින් සමන්විත නිශ්චිතව හඳුනාගත හැකි වැඩ ක්‍රියාකාරමෙන් කටයුතු වන අතර රාජකාරියක් යනු කටයුතු රාශියකින් සමන්විත පුද්ගලයෙකු ඉටු කරන වඩා විශාල වැඩ කොටසකි. රාජකාරිය කටයුතුවලට වඩා පුළුල් වේ. වගකීමක් යනු කටයුතු හා රාජකාරි නිසි ලෙස නැතහොත් අපේක්ෂිත පරිදි ඉටු කිරීම පිළිබඳව ඇති බැඳීමයි. කටයුතු තුළින් රාජකාරියක් ඇති වන අතර, රාජකාරිය වගකීමට බැඳේ. මේ නිසා මෙම අංග තුන අතර, අන්තර් සම්බන්ධතාවයක් පවතී.

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)

(ආ)

~~1. භාණ්ඩය හෝ සේවාව හෝ සඳහා වූ ඉල්ලුම~~
2. ආයතනයේ පරමාර්ථයේ
3. නිෂ්පාදන ක්‍රමය
4. ආයතන සේවක විශ්‍රාම යාම
5. ඉල්ලා අස්වීම
6. උසස් වීම
7. ඉවත් කිරීම
8. සේවා නියුක්තිය අවසන් කිරීම
9. වර්තමාන හා අනාගත මූල්‍ය තත්ත්වය
10. අනාගත ව්‍යාපෘති

(කරුණකට 1/2 බැගින් ½ x 4 = ලකුණු 02)

(v) (අ) සාධාරණ හේතුවක් නොමැතිව සේවකයකු සේවයෙන් ඉවත් කළ බව කම්කරු විනිශ්චය සභාවකින් තීන්දු කළහොත් එම සේවකයාට ලබාගත හැකි සහන දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ආයතනයක් විසින් නියමිත පරිදි වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රම (OHS) භාවිත නොකිරීම තුළින් ව්‍යාපාරයට සිදුවන අහිතකර බලපෑම් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) (ඕනෑම 2)

1. සේවයේ නැවත පිහිටුවීම ලබාගැනීම
2. වන්දි ලබා ~~දීම~~ ලබාගැනීම

(කරුණකට ලකුණු 01 බැගින් 1 x 2 = ලකුණු 02)

(ආ)

1. සේවක වන්දි රක්ෂණය සඳහා වන වාරිකය ඉහළ යාම
2. සේවක වන්දි ගෙවීම ඉහළයාම
3. සේවක අතෘප්තිය හා අසහනය ඇති වීම
4. සේවක ගුණාත්මකභාවය පහළ යාම
5. උපකරණවලට අලාභ හානි සිදු වීම
6. අනවශ්‍ය ලෙස වෛද්‍ය වියදම් ඉහළ යාම / වෛද්‍ය ගෙවීම් ඉහළ යාම
7. ආයතනයේ කීර්තිනාමයට හානි සිදුවීම
8. සේවක ඵලදායිතාවය පහළ වැටීම
9. සේවක පිරිවැටුම ඉහළ යාම
10. සේවක ප්‍රමාදිතාව ඉහළ යාම
11. නීතිමය වියදම් ඉහළ යාම

(කරුණකට ලකුණු 01 බැගින් 1 x 2 = ලකුණු 02)

8. (i) (අ) 'තොරතුරු විවිධ නිර්ණායක අනුව වර්ග කළ හැක.' ස්වභාවය අනුව තොරතුරු වර්ග සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) තොරතුරු පද්ධතියක කාර්ය හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

(අ) 1. ප්‍රමාණාත්මක
2. ගුණාත්මක

(ලකුණු 02)

(ආ) 1. අදාළ පාර්ශවයන්ට නිවැරදි තොරතුරු සන්නිවේදනය කිරීම.
2. නිෂ්පාදිත ගුණත්වය ඉහළ නංවාලීමට සහාය වීම.
3. ආයතනයේ පිරිවැය අවම කිරීම සඳහා සහාය වීම.
4. තරඟකාරිත්වයට සාර්ථකව මුහුණදීමේ වාතාවරණයක් සැලසීම.
5. කළමනාකරණ කාර්යයන්හි සාර්ථකභාවය තහවුරු කිරීම.
6. අවශ්‍යය කවර හෝ අවස්ථාවකදී අවශ්‍යය පාර්ශවයන්ට අදාළ තොරතුරු ලබා දීම.

(කරුණකට 1/2 බැගින් 1/2 x 4 = ලකුණු 02)

(ii) (අ) පද්ධති මෘදුකාංග හා යෙදවුම් මෘදුකාංග අතර ඇති වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) ආලෝක සමාගම නම් සේවක ශ්‍රේණි සඳහා යෝග්‍ය වන තොරතුරු පද්ධති පිළිබඳව සලකා බලමින් සිටී. පහත සඳහන් එක් එක් ශ්‍රේණි සඳහා යෝග්‍ය තොරතුරු පද්ධතිය නම් කරන්න.

1. ඉහළ කළමනාකරණය
2. මධ්‍ය කළමනාකරණය
3. තාක්ෂණ නිලධාරී
4. ලිපිකරු

(ලකුණු 02 යි)

(අ) පරිගණක පද්ධතියක පද්ධති මෘදුකාංග තොරතුරු පද්ධතියේ සම්පත් පාලනය කිරීම හා ඒවා සමඟ අන්තර් සම්බන්ධතාවය සිදු කරන අතර යෙදවුම් මෘදුකාංග පරිගණකයක් තුළ ඇති සියලු ම යෙදවුම් වැඩසටහන කළමනාකරණය සිදු කෙරේ.


(වෙනසට ලකුණු 02)

(ආ) 1. ඉහළ කළමනාකරණය - ESS
2. මධ්‍ය කළමනාකරණය - MIS/DSS
3. තාක්ෂණික නිලධාරී - KWS
4. ලිපිකරු - TPS/ OAS

(නිවැරදි පිළිතුරු 1කට 1/2 x 4 = ලකුණු 2)

(iii) (අ) ව්‍යාපාර කටයුතු සඳහා අන්තර්ජාලය භාවිත කිරීමෙන් ව්‍යාපාරයකට ලැබෙන වාසි හතරක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) 'විද්‍යුත් තැපැල් (email) ලිපිනයක් උපාංග කිහිපයකින් සමන්විත වේ.' පහත දැක්වෙන විද්‍යුත් ලිපිනයෙහි *A* හා *B* යන ස්ථානවලට අදාළ සුදුසු පදය ලියන්න. (ලකුණු 02 යි)




(අ) 1. විද්‍යුත් වානිජ කටයුතු සඳහා යොදා ගැනීම
2. භාණ්ඩ හා සේවා පිළිබඳව ප්‍රචාරණය කිරීම කළ හැකි වීම.
3. තම තරගකරුවන් පිළිබඳ අවශ්‍යය කෙරෙන වැදගත් තොරතුරු ක්ෂණිකව ලබා ගත හැකි වීම.
4. සන්නිවේදන පිරිවැය අවම වන ලෙසට යොදා ගැනීම.
5. තමා සතු වෙළෙඳපොළ ලෝකය පුරා ව්‍යාප්ත කිරීමට
6. තොරතුරු පහසුවෙන් හා වේගවත්ව ලබා දීමට
7. ව්‍යාපාර ආයතන සමාජ ජාල උපාකර කර ගනිමින් තම ව්‍යාපාර කටයුතු සිදු කිරීම.
8. පුහුණුව හා සංවර්ධනයට
9. සේවකයන් බඳවා ගැනීමට
10. ගෙවීම් කිරීමට පහසු වීම (කරුණකට 1/2 බැගින් 1/2 x 4 = ලකුණු 2)

(ආ) A = User name (පරිශීලක නාමය)
B = Country code (රටේ කේතය) (දෙකකට ලකුණු 02යි.)

(iv) (අ) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීම තුළින් ව්‍යාපාරිකයකුට ලබාගත හැකි වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර සැලැස්මෙහි අන්තර්ගත විධායක සාරාංශ පිළියෙල කිරීමේ ප්‍රධාන අරමුණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(අ) 1. ව්‍යාපාර සැලැස්ම මගින් ව්‍යාපාරය අනාගතයේදී යා යුත්තේ කොතනටද යන්න පෙන්නුම් කිරීම.
2. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන්ට ව්‍යාපාරය පිළිබඳ අවබෝධයක් ලබා දීම.
3. ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමට
4. ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් හඳුනා ගැනීමට
5. අනාගත ව්‍යාපාරික කටයුතු මනා ලෙස සංවිධානය කර ගැනීමට
6. ව්‍යාපාරයේ කාර්ය සාධනය ඇගයීමට
7. ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට
8. සේවකයන් ආකර්ෂණය කර ගැනීමට
9. නියාමනය හා පාලනයට
10. ව්‍යාපාරයේ වර්ධනය සඳහා වන සඵලදායී උපායමාර්ග නිර්මාණය කිරීම.

(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4ට ලකුණු 02)

(ආ) ව්‍යාපාර සැලැස්මක ඇතුළත් මූලික කරුණු සංක්ෂිප්ත කොට දැක්වීමයි.

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)

(v) (අ) ව්‍යාපාර සැලැස්මෙහි අඩංගු මූල්‍ය සැලැස්ම ව්‍යාපාරිකයකුට වැදගත්වන අවස්ථා හතරක් දක්වන්න.

(ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී පාරිසරික ඇගයීමක් සිදු කිරීමේ අවශ්‍යතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (Project [illegible])

(ලකුණු 02 යි)

(අ)

1. ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රමාණය නිගමනය කිරීම හා සම්පාදනය කර ගැනීමට
2. ව්‍යාපාරයේ අරමුදල් ආයෝජනය කිරීම පිළිබඳ තීරණ ගැනීමට
3. මුදල් ඌනතාවයක් ඇති විය හැකි කාලය හඳුනා ගෙන ඊට පිළියම් යෙදීමට
4. මුදල් අතිරික්තයක් ඇති වන කාලය හඳුනාගෙන ඒ මුදල් ඵලදායී කටයුතුවල යෙදවීමට

(කරුණකට ලකුණ 1/2 බැගින් කරුණු 4ට ලකුණු 02)

(ආ) පරිසර හිතකාමී බව සොයා බැලීම ඉතා වැදගත් වේ. පරිසර හිතකාමී ද්‍රව්‍ය භාවිතයට ගැනීම ඉවතලන ද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම සොයා බැලීම ආදියෙන් පරිසරය රැක ගැනීමේ ක්‍රියාවලිය විශ්ලේෂණය කළ යුතු යි.

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)

(ලකුණු 20)